ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන 2022/2023

4 වන මට්ටම - අවසාන පරීක්ෂණය

**EPU4337 - මුල් ළමාවිය සහ ප්‍රාථමික වසරවල සිංහල භාෂාව ඉගැන්වීම.**

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2024.03.10 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

**1 වන කොටස**

01. "කනට ඇසෙන ශබ්ද සියල්ලක් ම වාග් විද්‍යාත්මක අධ්‍යයනයන්හි දී වැදගත් නොවේ." මෙහි අදහස කෙටියෙන් පැහැදිලි කරන්න.

02. පහත සඳහන් ශබ්දවල උච්චාරණ ස්ථාන ශබ්දය ඉදිරියෙන් ලියන්න.

| ශබ්දය | උච්චාරණ ස්ථානය |
|---|---|
| ඕෂ්ඨජ | |
| දන්තජ | |
| දන්තෝපචාරජ | |
| මූර්ධජ | |
| තාලුජ | |

03. පදයක පදාණු යෙදෙන අනුපිළිවෙළ අනුව පදාණු වර්ග හතරක් යටතේ කාණ්ඩ කළ හැකිය. එම පදාණු වර්ග හතර (04) නම් කරන්න. එම එක් එක් පදාණු සඳහා උදාහරණයක් බැගින් ලියන්න.

04. ක්‍රියාකාරීත්වය අනුව වාක්‍ය වර්ග කිරීමේ දී වාක්‍ය ප්‍රභේද පහක් (05) හඳුනා ගත හැකිය. එම වාක්‍ය ප්‍රභේද පහ (05) නම් කරන්න.

05. "ඕනෑම භාෂාවක සෑම වාක්‍යයක් ම වචන දාමයකි. එහෙත් සෑම වචන දාමයක් ම වාක්‍යයක් නොවේ." මෙම අදහස උදාහරණ ඉදිරිපත් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

06. වාක්‍ය නිර්මාණය ආශ්‍රිත රීති තුනක් (03) ලියන්න. එම එක් රීතියක් උදාහරණ දෙකක් (02) ඇසුරු කරගෙන පැහැදිලි කරන්න.

07. සන්නිවේදන නිපුණතා සාක්ෂාත් කර ගැනීමෙහි ලා ප්‍රාථමික අධ්‍යාපන අවධියේ දරුවන් සඳහා සිංහල භාෂාව ඉගැන්වීමේ අරමුණු පහක් (05) ලියන්න.

08. ප්‍රාථමික අධ්‍යාපන අවධියේ දී භාවිත කරනු ලබන ප්‍රධාන ඉගැන්වීම් ක්‍රමවේද තුන (03) නම් කරන්න.

(ලකුණු 5 X 8 = 40)

## 02 - කොටස

09. (i.) "සවන්දීම, කතා කිරීම, කියවීම ලිවීම යනු චතුර්විධ (සතර ආකාර) භාෂා කුසලතා වේ." සිසුන් තුළ සවන්දීමේ කුසලතාව සංවර්ධනය කිරීමේ වැදගත්කම් **පහක් (05)** සාකච්ඡා කරන්න. (ලකුණු - 10)

(ii.) සිසුන් තුළ සවන්දීමේ කුසලතාව සංවර්ධනය කිරීම සඳහා පෙර පාසල් ගුරුවරියකට සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් **පහක් (05)** ලියන්න. එම ක්‍රියාකාරකම් වලින් දෙකක් පියවර වශයෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 10)

10. (i.) "දරුවන් තුළ කතා කිරීමේ (කථන) කුසලතාව සංවර්ධනය කිරීමේ දී දරුවා හැදෙන වැඩෙන පවුල් පරිසරය වැදගත් ම සාධකයක් වේ." දරුවාගේ කතා කිරීමේ (කථන) කුසලතාව සංවර්ධනයට යෝග්‍ය පරිසරයක් නිවස තුළ පවත්වාගෙන යන ආකාරය ක්‍රියාකාරකම් **පහක් (05)** ඇසුරු කරගෙන සාකච්ඡා කරන්න.
(ලකුණු - 10)

(ii.) සිසුන් තුළ කතා කිරීමේ (කථන) කුසලතාව සංවර්ධනය සඳහා ගුරුවරයෙකුට පන්තිකාමරය තුළ සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් **පහක් (05)** පැහැදිලි කරන්න.
(ලකුණු - 10)

11. (i.) "ලිවීම හා කියවීම කුසලතා සංවර්ධනයට පළමුව දරුවන් තුළ පෙර කියවීම හා පෙර ලිවීම කුසලතා සංවර්ධනය කිරීම වැදගත් වේ." ඔබ මෙම අදහස හා එකඟ වන්නේ ද? කරුණු ඉදිරිපත් කරමින් ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු - 10)

(ii.) "පෙර ලිවීම කුසලතාව සංවර්ධනය සඳහා පෙර පාසල තුළ ක්‍රියාත්මක කළ හැකි **සියුම් චාලක කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම්" පහක් (05)** නම් කර එම ක්‍රියාකාරකම් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 10)

12. (i.) දරුවකුගේ චතුර්විධ භාෂා කුසලතා සංවර්ධනය කෙරෙහි **සමාජීය හා ශාරීරික** බලපෑම විමර්ශනය කරන්න. (ලකුණු - 10)

(ii.) "කුඩා දරුවන් බොහෝ දුරට වැඩිහිටියන් අනුකරණය කරමින් භාෂාව ඉගෙන ගන්නා නිසා ගුරුවරුන් හා වැඩිහිටියන් භාෂා භාවිතය පිළිබඳ සුසමාදර්ශ වශයෙන් කටයුතු කිරීම ඉතා වැදගත් වේ." ඒ අනුව දරුවන් සමඟ කතා කිරීමේ දී ආදර්ශයක් වන ආකාරය කරුණු **පහක් (05)** මඟින් තහවුරු කරන්න. (ලකුණු - 10)

13. (i.) "දරුවන් තුළ භාෂා කුසලතා සංවර්ධනය කිරීම සඳහා ගුරුවරයාට **තක්සේරුකරණය** ඉතා වැදගත් මෙවලමක් වේ." මේ පිළිබඳව ඔබ දරන මතය උදාහරණ සහිතව ඉදිරිපත් කරන්න. (ලකුණු - 10)

(ii.) ශිෂ්‍යකේන්ද්‍රීය අධ්‍යාපනය තුළ **භාෂා කුසලතා සංවර්ධනයේ දී සුසාධ්‍යකාරකයෙකු** ලෙස ගුරුවරයාගේ **භූමිකාව** පිළිබඳ පුවත්පතකට කෙටි ලිපියක් ලියන්න.
(ලකුණු - 10)

- හිමිකම් ඇවිරිණි. -